ඇමරිකාවේ සේවය කර විශ්‍රාම ලබා මෙරටට පැමිණි අයෙකු ඝාතනය කර වළ දමා තිබියදී පොලිසිය විසින් සොයාගත් පුවත වාර්තා කරනා මාධ්‍ය, ඊට අදාළව සැකය එල්ල වී තිබූ තවත් අයෙකු දිවි තොර කරගෙන ඇති බවද වාර්තා කර තිබේ.

මේ සම්බන්ධයෙන් වාර්තා කර ඇති මාධ්‍ය තුළ දිවි තොර කරගත් ආකාරය සඳහන් කර ඇත. එසේම, හදිසි උපකාරක අංක ද සඳහන් කර නැත.

දිවි තොර කරගත් ආකාරය සඳහන් කිරීම, අනුකාරක සිදුවීම් වලට හේතුවක් විය හැක. එසේම, හදිසි උපකාරක අංක සඳහන් නොකිරීම නිසා, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති තවත් අයෙකුගේ දිවි බේරාගැනීමේ ඉඩප්‍රස්තාව ගිලිහී යා හැක.

ඒ අනුව, මෙම පුවත්පත්, වගකීම් සහගත ලෙසින් දිවි තොර කරගැනීමක් සම්බන්ධ වන පුවතක් වාර්තා කර ඇතැයි ඔබ සිතන්නේ ද?

උපකාරක අංකයක් සඳහන් කරමු, ජීවිතයක් රැකගනිමු!

හදිසි උපකාරක අංක:
* CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
* ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

(ඩේලි නිව්ස් හැරෙන්නට මෙහි දක්වා ඇති සිංහල භාෂා පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ, එදින මෙම පුවත වාර්තා වී නොතිබුණි.)

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf

** අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න!ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!